සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

12657

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2015
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................................................ විභාග අංකය :- ........................

සැලකිය යුතුයි:

- I කොටසේ සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- II කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු සපයා පළමු කොටසට අමුණා බාර දෙන්න

## I - කොටස

- අංක 1 - 5 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(01) ඔබ සතු උසස් ගති ලක්ෂණ, සුවිශේෂී හැකියා අන්‍යයන් විසින් අගය කරනු ලබන විට ඔබ තුළ ඇති වන හැඟීම් .................................... ලෙස හැඳින්විය හැකි ය.
(ආත්ම විශ්වාසය, ආත්මාභිමානය, ආත්ම ගරුත්වය)

(02) සමාජයේ යහපතට හේතුවන පුද්ගලයකු ලෙස .................................... සඳහන් කළ හැකි ය.
(ගුරුවරයා , අපරාධකරු , වෙළෙන්දා)

(03) "හෙළයේ නවකථා සක්විති" යන අන්වර්ථ නාමයෙන් හැඳින්වූ ප්‍රසිද්ධ ලේඛකයා .................................................... මහතා ය.
(කුමාරතුංග මුනිදාස , ඩබ්ලිව්. ඒ. සිල්වා , ටී.බී.ඉලංගරත්න)

(04) සීඝ්‍රයෙන් වෙනස්වන ලෝකයේ නව තොරතුරු අප වෙත ගලා එන මාර්ග කිහිපයකි. ඒ අතරින් දත්ත ගබඩා කරන දියුණුම මාධ්‍යය .............................................. ය.
(පරිඝනක , පොත්පත්. පුස්තකාල)

(05) "මිනිසා සාක්ෂාත් කරගත් හුරු පුරුදු හා හැකියාවන් ඇතුළත් සංකීර්ණ සමස්තය" සංස්කෘතිය ලෙස .................................................... විසින් හඳුන්වා ඇත.
(ඊ.බී.ටයිලර් , ජෙෆ්රි බාවා , ඇල්බට් අයින්ස්ටයින්)

- අංක 6 සිට 10 දක්වා ප්‍රකාශන නිවැරදිනම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

(06) අප රට තුළ ජීවත්වන සියළු ජනතාව, එක් ජාතියක් වශයෙන් කටයුතු කිරීම රටේ සංවර්ධනයට හේතු වේ. ( )

(07) ක්‍රීඩා කිරීම තුළින් පුද්ගලයා තුළ සමබර පෞරුෂයක් ගොඩනැගේ. ( )

(08) ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් සුරැකීම පොලිසිය මගින් ඉටු කරනු ලැබේ. ( )

(09) ආචාර්ය ආනන්ද කුමාරස්වාමි ශ්‍රීමතාණන් පෞරාණික ලාංකික දේශීය කලාව හා දැනුම ලොවට හෙළි කළ මහා විද්වතෙකි. ( )

(10) ලාභ හා ප්‍රශංසා ලැබෙන විට උඩඟු නොවිය යුතු ය. ( )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

(11) ඔබේ ජීවිතය ලස්සන කරන, පොහොසත් කරන, ප්‍රීතිමත් කරන හැඟීම් හා ගුණාංග ........................................ ලෙස හැඳින්වේ.

(12) රාජ්‍ය අයිතිය තහවුරු කරන සංකේතය ................................ යි.

(13) ඔබගේ මවගේ අයියාගේ බිරිඳ පිළිබඳ ඔබට ඇති ඥාතීත්වය හඳුන්වන්නේ ................................ නමිනි.

(14) සුහදශීලී බව, චාම් දිවිපැවැත්ම, අන්‍යයන්ට ආදරය කරුණාව දැක්වීම යහපත් පුද්ගලයකු සතු ........................................ වේ.

(15) පුද්ගලයන් හෝ කණ්ඩායම් දෙකක් හෝ වැඩි ගණනක් අතර ඇතිවූ යම් මතභේදයක ප්‍රතිඵලයක් වශයෙන් ........................................................ ඇති විය හැකි ය.

- අංක 16 -20 දක්වා " A" කොටසේ ඇති ප්‍රකාශයන්ට ගැලපෙන ප්‍රකාශ " B" කොටසින් තෝරා අදාල අක්ෂරය වරහන තුළ ලියන්න.

| A | | | B |
|---|---|---|---|
| (16) ගැටුමක් ඇතිවීමට බලපාන හේතුවකි. | ( ) | a. | පුද්ගල සංයමය |
| (17) අන්තර් ශිෂ්‍ය සම්බන්ධතා ගොඩනැගෙන පාසල් සංවිධානයකි. | ( ) | b. | මහත්මා ගාන්ධිතුමා |
| (18) සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල යෙදීම නිසා ඇති වේ. | ( ) | c. | ආක්‍රමණශීලී බව |
| (19) දේශානුරාගී හැඟීම් වර්ධනය කරමින් චාම් දිවිපැවැත්මක් ගත කළ පුද්ගලයෙකි. | ( ) | d. | ක්‍රීඩා කමිටුව |
| (20) ශ්‍රී ලාංකිකයන් වන අපට අප කැමති ඕනෑම ආගමක් ඇදහීමේ නිදහස | ( ) | e. | මූලික අයිතිවාසිකම් |
| | | f. | මහිලා සමිතිය |

(ලකුණු 2 × 20 = 40)

## II - කොටස

* පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.

* තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(01) තුන්වන වාරය අවසානයේ කරන්නට යෙදුණු ඔබ ප්‍රදේශයේ ස්වේච්ඡා සංවිධාන පිළිබඳ තොරතුරු අධ්‍යයනය වාර්තාව ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඉහත ක්‍රියාකාරකම සංවිධානය කර ගැනීමේ දී ඔබට / ඔබ කණ්ඩායමට ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ඔබ/ඔබ කණ්ඩායම විසින් තොරතුරු අධ්‍යයනය කළ ස්වේච්ඡා සංවිධාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iii) ඉහත එක් ස්වේච්ඡා සංවිධානයක ඔබට මුණගැසුණු නිලධාරීන්ගේ නිලනාම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iv) එම එක සංවිධානයක් පිහිටුවීමේ අරමුණු දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(v) එම එක් සංවිධානයක් ගමේ /ප්‍රදේශයේ යහපතට කර ඇති සේවාවන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(vi) අනාගතයේ දී එවැනි සංවිධානයක තිලයක් ඔබට ලැබුණහොත් ඔබ විසින් එම සංවිධානයේ දියුණුවට ඉදිරිපත් කරන යෝජනා දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

(02) (i) "ඔබ පතන ඕනෑම අයකු වීමට, ඕනෑම දෙයක් කිරීමට ඔබට ශක්තියක් ඇත. ඔබ ඇත්තෙන්ම ආශ්චර්යවත් ය." එසේ පැවසූ අධ්‍යාපනඥයා නම් කරන්න. (ලකුණු 02)

(ii) සමාජයට අයහපත් ප්‍රතිඵල ගෙන දෙන බලවේග දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) නිවැරදි ජීවන අරමුණක් කරා ගමන් කිරීමේ දී ඔබ ගත යුතු ක්‍රියාමාර්ග දෙකක් ලියා ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(03) සෑම පුද්ගලයෙකුම තම උපත සමඟ ප්‍රථමයෙන් සාමාජිකත්වය ලබන සමාජ ඒකකය පවුලයි.

(i) පවුලෙන් ඔබට ලැබෙන දේවල් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) විස්තෘත පවුල් ඒකකයක ඇති වැදගත්කම් හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) අසල්වාසීන් සමඟ සහයෝගයෙන් කටයුතු කරන අවස්ථා දෙකක් සඳහන් කර එසේ කිරීමෙන් ඔබට / ඔබේ පවුලට ලැබෙන වාසි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)


(04) (i) ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාව පෙන්නුම් කරන සංකේත දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය හා ජාතික පක්ෂියා නම් කරන්න. (ලකුණු 04)

(iii) ජාතික කොඩිය ඔසවනු ලබන අවස්ථා දෙකක් සඳහන් කර එම අවස්ථාවල අනුගමනය කළ යුතු පිළිවෙත් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(05) (i) පුද්ගලයකුගේ තොරතුරු හා දත්ත සොයා ගත හැකි විවිධ ලේඛන තිබේ. එම ලේඛන අතරින් උප්පැන්න සහතිකය හැර වෙනත් ලේඛන දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) සන්නිවේදන තාක්ෂණයට අදාළ මෙවලම් දෙකක් පහත දැක්වේ.




A



B

අ. ඉහත A හා B රූප සටහන්වල දැක්වෙන මෙවලම් දෙක හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 02)

ආ. එක් එක් මෙවලමෙන් සිදුවන කාර්යයන් එක බැගින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න. (ලකුණු 02)

(iii) පුස්තකාලයක දී හැසිරෙන ආකාරය කරුණු දෙකක් යටතේ විස්තර කරන්න. (ලකුණු 05)

(06) (i) රටක මූලික අයිතිවාසිකම් සඳහන් කර ඇති ලේඛනය නම් කරන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් සුරැකීමට පිහිටුවා ඇති ආයතන දෙක නම් කරන්න. (ලකුණු 04)

(iii) පවුලේ සාමාජිකයන්, ඥාතීන්, අසල්වාසීන් හා ගම්වාසීන් අතර ද විවිධ අරමුණු හා අපේක්ෂා පදනම් කරගෙන අන්තර් සම්බන්ධතා ගොඩනැගේ.

A. අන්තර් සම්බන්ධතා ඇතිවීමට බලපාන හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

B. අන්තර් සම්බන්ධතා පැවැත්වීමේ වාසියක් සඳහන් කර එය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(07) අර්ථවත් ජීවිතයක් ගත කිරීම සඳහාත් ඒ තුළින් සමාජයේ යහපැවැත්මක් ඇතිකර ගැනීම සඳහාත් සාරධර්මානුකූල වීම මිනිසාගේ යුතුකමයි.

(i) ඔබට පාසලේ දී රැකිය හැකි සාරධර්ම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් පිරුළු දෙකෙන් මතුවන සාරධර්මය ලියා දක්වන්න.

A. ඇවිලෙන ගින්නට පිදුරු නොදමන්න.

B. පැමිණි දුක් පැණි රස ය. (ලකුණු 04)

(iii) පරිසර සංරක්ෂණය පිළිබඳ ප්‍රදර්ශනයක දී ප්‍රදර්ශනය කළ හැකි "සාරධර්ම සංරක්ෂණයේ" වැදගත්කම පෙන්වන වැකි පහක් ලියා දක්වන්න. (ලකුණු 05)